**සමෘද්ධි අරමුදල - 2018**

**----------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

සමෘද්ධි අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබුවේද ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 07 වැනි ඡේදය ප්‍රකාරව ගනුදෙනු අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන් ඒවා සිදුවන අවස්ථාවේදී හඳුනාගෙන අදාළ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වුවද, සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති පවත්වාගෙන යන ගොඩනැගිලි 1286 කින් ලැබිය යුතු කුලී ආදායම රු. 15,432,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට උපලබ්ධි වූ තත්‍ය ආදායම රු. 489,000 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2017 වර්ෂයේ සිට ගොඩනැගිලිකුලී මෙම අරමුදලට ගෙන්වා ගැනීම 2017/07 සමෘද්ධි ප්‍රජමූල බැංකු චක්‍රලේඛ ප්‍රකාරව අත්හිටුවා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ගිණුම් ප්‍රතිපත්ති සටහන් (i) යටතේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සකස් කර ඇති බව දක්වා ඇති අතර සටහන් | 2017 වර්ෂයේ සිට ගොඩනැගිලිකුලී මෙම අරමුදලට ගෙන්වා ගැනීම 2017/07 සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ ප්‍රකාරව අත්හිටුවා ඇත. | -එම- |

අංක (iv) යටතේ සමෘද්ධි බැංකු/ බැංකු සමිතිවලින් ගොඩනැඟිලි කුලී ලෙස වාර්ෂිකව අයකරනු ලබන මුදල්, උපලබ්ධි වූ තත්‍ය ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කරනු ලබන බව දක්වා තිබුණි.

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | **නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද** | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | රු. | | | | | |
| ලැබියයුතුධීවර හා සත්ව පාලන සහ ලැබියයුතු කෘෂි ශේෂ | රු.16,822,873 | උපලේඛන හා ශේෂ සනාථ කිරීම් | පවත්නා | පද්ධතිය හඳුන්වා දිය යුතුය | ලැබියයුතු මුදල් පිළිබඳව ශේෂ සනාථ කිරීම් කඩිනමින් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාළ උපලේඛන හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2014 වර්ෂයේදී දැයට කිරුළ වැඩසටහනට සමගාමීව දිස්ත්‍රික්ක 03 ක සංවර්ධන කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මහාභාණ්ඩාගාරයෙන් නැවත ප්‍රතිපූරණය කරගත හැකිය යන පදනම මත රු. 212,000,000 ක ණය මුදලක් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අරමුදලෙන් ලබා දී තිබුණි. එහෙත් 2018 ජනවාරි 02 දිනැති BD/RDS/331/01/01 ලිපියෙන් ඉහත කරුණ සම්බන්ධයෙන් මහාභාණ්ඩාගාරයෙන් ලිඛිත අනුමැතියක් ලබා දී නොමැති බැවින් මෙම මුදල් ප්‍රතිපූර්ණය කිරීමට හැකියාවක් නොමැති බව ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් දන්වා එවා තිබුණි. | ප්‍රතිපූර්ණය කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් දිගටම ඉල්ලීම් කර ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 395 (ඇ) | මුදල් රෙගුලාසි ප්‍රකාරව සෑම මසකම බැංකු සැසඳුම් ඊළඟ මස 15 දිනට පෙර පිළියෙල කර පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | බැංකු සැසඳුම් යාවත්කාලිනකර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මගින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876(3) | අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර දිවිනැගුම (සමෘද්ධි) සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනය කර නොතිබුණි. | දිවිනැගුම පනතේ 36 වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන අරමුදල පිහිටුවන තෙක් මෙම අරමුදල පවත්වාගෙන යනු ලැබේ. | අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.159,271,733 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 127,501,983 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 286,773,716 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති ගොඩනැඟිලි සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට වියදම් නොකිරිම අතිරික්තය ඇතිවිමට හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ගොඩනැඟීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීම මෙම අරමුදලේ | සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛ අංක 2017/07 ප්‍රකාරව වියදම් දැරිම | අරමුදලේ පරමාර්ථය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරමාර්ථය වුවත් සමෘද්ධි ප්‍රජා මුල බැංකු චක්‍රලේඛ අංක 2017/07 ප්‍රකාරව වියදම් දැරීම අත්හිටුවා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. | අත්හිටුවා ඇත. | |
| (ආ) | ජපන් ආයතනයකින් පරිත්‍යාග ලෙස සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය වෙත ලැබී තිබූ බස්රථය ගෙන්වීම සඳහා රේගු ගාස්තු හා නිදහස් කර ගැනීමේ ගාස්තු ගෙවීම් සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන නොමැති බැවින් අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලුම්කර තිබුණද 1994 වර්ෂයේ නිෂ්පාදිත මෙම බස්රථය ගෙන්වීම ආර්ථික හා ඵලදායි නොවන නිසා ප්‍රතිපාදන ලබාදිය නොහැකි බව අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා එවා තිබුණි. එහෙත් 2018 පෙබරවාරි 24 දින මෙම බස්රථය හම්බන්තොට වරාය වෙත පැමිණ තිබූ අතර 2018 මාර්තු 14 වරායෙන් නිදහස් කර ගැනීමට සමෘද්ධි අරමුදලින් රු. 2,637,705 ක් ගෙවීම් කර තිබුණි. | ආනයන බලපත්‍රය කල් ඉකුත්වීමේ දිනය මාර්තු 18 වූ බැවින් හා නැව් මගින් ගෙන්වීමට සාධාරන කාලයක් නොමැති බැවින් බස්රථය නැව්ගත කරීම සඳහා ඊමේල් පණිවිඩයක් යවා ගෙන්වා ගන්නා ලදි. රේගු ගාස්තු ලෙස රු. 2,552,900 ක මුදලක් ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවීමට නියම වූ අතර එම ගෙවීම සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් අතිරේක ප්‍රතිපාදන ලබා නොදුන් හෙයින් බස් රථය හම්බන්තොට වරායෙන් නිදහස් කරගැනීම ප්‍රමාදවන නිසා වරාය ගාස්තු හා තවදුරටත් ප්‍රමාද වීම හේතුවෙන් දඩ මුදල් ගෙවීමට සිදුවන බැවින් ජාතික සභාවේ ආවරන අනුමැතියට යටත්ව සමෘද්ධි අරමුදලින් අදාල ගාස්තුව ගෙවීමට කටයුතු කර ඇත. | අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු මුදල්වල ඇතුලත් එකතුව රු. 16,822,875 ක් වූ කෘෂි , ධීවර හා සත්ව පාලන ව්‍යාපෘති සඳහා සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිට 2007 දක්වා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත සමෘද්ධි අධිකාරිය මගින් නැවත අයකිරීමේ පදනම මත ප්‍රතිලාභීන්ට චක්‍රීය පදනම මත ලබා දී තිබුණු ණය මුදල් විය. මෙම ණය අයකිරීම් 2007 ජුලි 16 දිනැති අංක ස/අධි/10/ජාස.ගම්/ චක්‍රීය අරමුදල දරන සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් ප්‍රකාරව ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල "ගම් පුබුදු ජීවනෝපාය චක්‍රීය" ගිණුමට බැර | 2007 වර්ෂයේ සිට වැඩසටහන ක්‍රියාත්මක කරගෙනයාමට ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත පවරන ලදි. එහෙයින් 2007 ට පෙර ලබාදී තිබූ ව්‍යාපෘතිවලට අදාල වාරික පමණක් ප්‍රධාන කාර්යාලයට ලැබෙනු ඇත. | අරමුදලේ පරමාර්ථය අනුව කටයුතු කළ යුතු අතර වාර්තා නිසි පරිදි ලබාගෙන ණය මුදල් පියවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට නියෝගකර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම වාර්තා ඉදිරිපත් වීමක් හෝ ණය මුදල් පියවීමක් සිදු වී නොතිබුණි. | | |
| (ආ) | අරමුදලේ පරමාර්ථය වූ ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති ගොඩනැගීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීම සඳහා ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති වලින් ගොඩනැගිලි කුලී ගෙන්වා ගැනීම, එකී ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති ගොඩනැගිලි නඩත්තු කිරීමට නවීකරණයට හා නව ගොඩනැගිලි ආරම්භ කිරීමට භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් බැහැරව අවශ්‍ය මූල්‍ය දායකය සැලසීම දක්වා තිබුණද 2017 ජූනි 9 දිනැති අංක 2017/7 දරන සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛය ප්‍රකාරව මෙම අරමුදලට මෙතෙක් බැරකරන ලද ගොඩනැගිලි කුලී සමෘද්ධි අරමුදලට බැර නොකරන ලෙසත් 2017 වර්ෂයේ සිට සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති විසින් එම මුදල් තමාගේම “ බැංකු ගොඩනැගිලි සංවර්ධන හා නඩත්තු අරමුදල් ගිණුම” කට බැර කරන ලෙසත් දන්වා තිබුණි. එම චක්‍රලේඛයේ ප්‍රතිපාදන හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ අරමුණු හා කළමනාකරණ තිරණ පිළිබඳව මතභේදාත්මක තත්ත්වයක් ඇතිවන බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, මෙම තීරණයට එළඹීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති 1,286 කින් ලැබිය යුතු කුලී ආදායම රු. 15,432,000 ක් වුවත් ලැබුණු ආදායම රු. 489,000 ක් පමණක් විය. | දිවිනැගුම පනතේ 36 වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන අරමුදල පිහිටුවීමෙන් පසු ඉදිරියේදි ගනුලබන තීරණ මත ඉදිරිකටයුතු සිදුකරනු ලැබේ. | අරමුදල පිහිටුවීමේ පරමාර්ථය අනුව කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877(2)(ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබු අතර 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2021 දෙසැම්බර් 10 දින ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වර්ෂයෙන් වර්ෂය විගණනය කිරීමෙන් පසු නැවත ඉදිරිපත් කිරීම හේතුවෙන් ප්‍රමාද විය. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877(1) රෙගුලාසිය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි. | අරමුදල සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන තීරණ මත ඉදිරි කටයුතු සිදුකරන ලැබේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ලේඛනය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

**4.3 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදල ව්‍යවස්ථාපිත කිරීම තුළින් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම හා විධිමත් පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. | නිරීක්ෂණයේ සඳහන් පරිදි ඉදිරියේදි කටයුතු කරමි. | අරමුදල ව්‍යවස්ථාපිත කිරීම තුළින් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |